ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } SPLG/MT/A /MaliPS/ 5/24/10

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මාර්තු 24 දින

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
2 5 MAR 2025
මාලිම්බඩ

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති කාර්යාලය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

සභා ලේකම්,
ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ.

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමඟ එවා ඇත.

02. මෙම කෙටුම්පත් වාර්තාවේ සාවද්‍ය හෝ එකඟවිය නොහැකි හෝ මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේනම්, මෙම ලිපියේ දින සිට දින 07ක් ඇතුළත මා වෙත දන්වා එවන්නේ නම් මැනවි.

03. මෙම කෙටුම්පත් වාර්තාවේ දැක්වෙන විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ඔබ අදහස් කරන්නේ නම් ඒ සඳහා මෙම ලිපියේ සඳහන් දින සිට දින 03ක් ඇතුළත මා විමසා ඒ සඳහා දිනයක් සහ වේලාවක් වෙන්කරවා ගත යුතුය.

04. ඉහත සඳහන් පරිදි දින 07ක් ඇතුළත ඔබගෙන් පිළිතුරක් නොලදහොත් එම කෙටුම්පත් වාර්තාව පදනම් කරගෙන අවසන් වාර්තාව නිකුත් කරන බව කරුණාවෙන් සලකන්න.

යූ.යූ.පී. පෙරේරා,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

යූ. යූ. පී. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, ගාල්ල.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

Scanned with CamScanner

"රහස්‍යයි"

-කෙටුම්පත-

මගේ අංකය:SPLG/MT/A/MaliPS/5/24/10

සභා ලේකම්

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ දැක්වෙන නිරීක්ෂණයන් සඳහා ඉදිරිපත් කරනු ලබන පිළිතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව විගණන මතය තීරණය කරනු ලැබේ.



Scanned with CamScanner

1.2. මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2024 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි ශේෂය රු.13,799,402 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. විස්තර උපලේඛන I හි දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ප්‍රාග්ධන ණයගැති ශේෂ 03 ක වටිනාකම් රු.1,253,618 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්මාන්තයේ නම | ගිණුම්ගත කළ වටිනාකම<br>රු. | ගිණුම්ගත කළ යුතු වටිනාකම<br>රු. | වැඩියෙන් ගිණුම් ගත කළ වටිනාකම<br>රු. |
|---|---|---|---|
| ❖ ගල් ඇන්ද කුට්ටිය ප්‍රජා ශාලාව ඉතිරි වැඩ අවසන් කිරීම | 5,307,432 | 4,697,078 | 610,354 |
| ❖ මාලිම්බඩ පොළ ඉහල මාලය ඉතිරි කොටස් සංවර්ධනය කිරීම | 7,062,201 | 6,468,346 | 593,855 |
| ❖ ගල්පමුණ වැවේවත්ත මාර්ගය ක්‍රිස්ට මහතාගේ නිවස අසල සිට ඉදිරියට සංවර්ධනය කිරීම. | 49,409 | - | 49,409 |
| | | | 1,253,618 |

(ඇ) සමලෝචිත වර්ෂය අවසානයට පැවති ප්‍රාග්ධන ණයහිමි ශේෂ 05 ක වටිනාකම රු.1,981,045 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. විස්තර උපලේඛන II හි දැක්වේ.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ප්‍රාග්ධන ණයහිමි ශේෂ 02 ක වටිනාකම රු.2,226,534 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. විස්තර පහත දැක්වේ.



Scanned with CamScanner

| කර්මාන්තයේ නම | ගිණුම්ගත කළ වටිනාකම රු. | ගිණුම්ගත කළ යුතු වටිනාකම රු. | අඩුවෙන් ගිණුම්ගත කළ වටිනාකම රු. |
|---|---|---|---|
| ❖ මාලිම්බඩ පොළ ඉහල මාලය ඉතිරි කොටස සංවර්ධනය කිරීම. | 7,062,201 | 8,333,397 | 1,271,196 |
| ❖ ගල්ඇන්ද කුට්ටිය ප්‍රජා ශාලාව ඉතිරි වැඩ අවසන් කිරීම. | 5,307,432 | 6,262,770 | 955,338 |
| | | | 2,226,534 |

(ඉ) හොරගොඩ බටහිර ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘතිය සංවර්ධනය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලෙස 2020 වර්ෂයේ ලැබී තිබූ රු.1,000,000 ක මුදලින් උපකරණ මිලදී ගැනීමට වැයවූ රු. 971,220 අඩුකර ඉතිරි මුදල වූ රු.28,780 ක් ප්‍රාග්ධන ණයහිමි යටතේ ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන ණයහිමියන් එම අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති සැපයුම් උපකරණ තොග ශේෂය රු.1,454 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| අයිතමය | ගිණුම්ගතකළ වටිනාකම රු. | ගිණුම්ගත කළ යුතු වටිනාකම රු. | වැඩියෙන්/අඩුවෙන් ගිණුම් ගතකළ වටිනාකම රු. |
|---|---|---|---|
| 500ml ගම් බෝතල් | 2,000 | 500 | 1,500 |
| පාට වාර්නිෂ් කොළ, රතු | 703 | 749 | (46) |
| | | | 1,454 |



Scanned with CamScanner

(උ) ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර තිබූ මුද්දර තැන්පත් ශේෂය රු. 18,335 ක් වුවද එය රු.14,882 ක් ලෙස රු.3,453 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද උපලේඛන අනුව ලැබිය යුතු උසාවි දඩ ශේෂය රු. 176,037 ක් වුවද එය රු.340,492 ක් ලෙස රු.164,455ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද උපලේඛන අනුව ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු. 9,713,580ක් වුවද එය රු.99,291,971 ක් ලෙස රු.89,578,391ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. විස්තර උපලේඛන III හි දැක්වේ.

1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.424,788 ක් වූ ගිණුම් විෂයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

| | ගිණුම් විස්තරය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | මැතිවරණ අත්තිකාරම් | 320,974 | විස්තරාත්මක උපලේඛන |
| (ii) | සභාවේ තැන්පත් | 50,000 | -එම- |
| (iii) | වීථි පහන් ණයගැති | 28,875 | ශේෂ සනාථන/උපයෝගී ලේඛන |
| (iv) | ප්‍රාග්ධන වියදම් ණයහිමි | 24,939 | කර්මාන්ත ලිපිගොනු නොමැති බව ප්‍රකාශය. |
| | | 424,788 | |



Scanned with CamScanner

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන මුද්දර තැන්පත් ශේෂය රු.14,882 ක් වුවද ඊට අදාළ උපලේඛන අනුව ශේෂය රු.13,382 ක් වීම නිසා රු.1,500 ක වෙනසක් පැවතුණි.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 16,032,335 ක් වූ ප්‍රාග්ධන ණයගැති ශේෂය තුල වර්ෂ 3 ඉක්ම වූ රු. 196,224 ක වටිනාකමින් යුතු ණයගැති ශේෂයන්ද ඇතුලත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 27,754,284 ක් වූ ප්‍රාග්ධන ණයහිමි ශේෂය තුල වර්ෂ 3 ඉක්මවූ රු. 249,943 ක වටිනාකමින් යුතු ප්‍රාග්ධන ණයහිමි ශේෂයක්ද ඇතුලත්ව තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.



Scanned with CamScanner

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.



Scanned with CamScanner

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.



Scanned with CamScanner

## 1.6 අනුකූල නොවීම

### 1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මු.රෙ. 104(4) | සභාව සතු අංක ZA-5084 දරන බැකෝ යන්ත්‍රයට අව කදී සිදුවී තිබූ වාහන අනතුරු සඳහා සමාලෝචිත අවසානයට පිළිවෙලින් මාස 6 ක් හා මාස 4 ක් ගතවූ අතර එකී අළුත්වැඩියා කටයුතු අවසන් කරගෙන නෙ එසේම මුදල් රෙගුලාසි ප්‍රකාරව අවසන් වාර්තා කිරීමටද කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසැ වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. 62,794,198 ක් අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදාය රු.15,269,110 ක් විය.



7

## .2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ) | වරිපනම් හා බදු | 2,181,500 | 2,153,143 | 2,133,097 | 238,593 | 4,335,700 | 1,994,663 | 1,909,010 | 218,547 |
| i) | කුලී | 4,072,200 | 3,564,685 | 3,768,021 | 101,177 | 9,147,500 | 3,173,969 | 3,097,857 | 304,513 |
| ii) | බලපත්‍ර ගාස්තු | 1,408,000 | 1,304,195 | 1,304,195 | - | 1,363,000 | 980,675 | 1,108,875 | - |
| iv) | වෙනත් අදායම් | 5,700,400 | 10,380,077 | 10,530,139 | 45,850 | 7,764,300 | 11,300,079 | 11,304,599 | 195,912 |
| | | 13,362,100 | 17,402,100 | 17,735,452 | 385,620 | 22,610,500 | 17,449,386 | 17,420,341 | 718,972 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය.

සමාලෝචිත වර්ෂය තුල ඇස්තමේන්තුගත ආදායම රු.13,362,100 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු. 718,972 ක හිඟ මුදල හා බිල් කිරීම් රු.17,402,100 ක් සමඟ රු.18,121,072 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුලදී මුළු අයවීම් රු.17,735,452 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු. 385,620 ක් විය.



Scanned with CamScanner

2.2.3 වරිපනම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් ශේෂය රු.67,844 ක් වූ අතර වරිපනම් ඒකක 421 කට අදාලව වර්ෂය තුලදී බිල් කිරීම් රු.253,223 ක් සමඟ රු.321,067 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.271,726 ක් වීම නිසා වර්ෂය අවසානයට වරිපනම් ඒකක 67 කට අදාලව රු. 49,341 ක හිඟ ශේෂයක් පැවතුණි. ඉන් රු. 14,447 ක් වූ ශේෂය වර්ෂ 5 කට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණි. එසේම රු.1,000 ට වැඩි හිඟ වරිපනම් ඒකක සංඛ්‍යාව 13 ක් වූ අතර එහි වානිජ ඒකක 7 ක් හා වානිජ නොවන ඒකක 6 ක් පැවතුනි.

(ආ) සභා බලප්‍රදේශයේ පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 17 කට අයත් ප්‍රදේශය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වන වගන්තිය ප්‍රකාරව දියුණුකළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන 2022 සැප්තැම්බර් 30 දිනැති අංක 2300 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර තිබූ අතර එහිදී නව වරිපනම් දේපල 5098 ක් හඳුනාගෙන තිබුණි. ගැසට් නිවේදනය නිකුත් කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 02 කට අධික කාලයක් ගතවී තිබුණද වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

2.2.4 කුලී.

පහත දක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කුලී ශේෂය රු. 304,513 ක් වූ අතර වර්ෂයේ බිල්කිරීම් රු. 3,564,685 ක්ද ඇතුලත්ව රු. 3,869,198 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී අයවීම් රු. 3,768,021 ක් වීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 101,177 ක් අයවිය යුතුව පැවතුනි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාව සතු වෙළෙඳ සංකීර්ණ 2 හි කඩ කාමර 43 න් කඩ කාමර 42 ක් බදුදී තිබූ අතර ඉන් කඩ කාමර 10 කින් රු.64,495 ක හිඟ ආදායමක් විය. ඉන් රු. 24,590 ක ශේෂයක් අවුරුදු 2 කට අධික කාලයක සිට අයවිය යුතුව පැවතුනි.



7

Scanned with CamScanner

(ඈ) 2000 හා 2001 වර්ෂයන්හිදී තෙලිජ්ජවිල පොළ භූමියෙහි පවත්වා ගෙන ගොස් තිබූ මස්කඩ 02 කට අදාළව රු. 36,683 ක බදු මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවීමට පැවතුණ අතර එම බදු මුදල් අයකර ගැනීම හා 2021 වර්ෂයේ පැවරු නඩු කටයුතු අවසන් කර තිබූ අතර, සභාව සතුව එම නඩු වාර්තා නොපැවතීම නිසා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. එම තොරතුරු සොයා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම සහ ආදායම් අයකර ගැනීමේ වගකීමට බැඳෙන නිලධාරීන්ගේ වගකීමක් වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

2.2.5 වෙනත් ආදායම්

සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 16,975 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු මුදලක් අයවිය යුතුව පැවති අතර එම ශේෂය වසර 5 කට අධික කාලයක සිට විය.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 340,492 ක් හා මුද්දර ගාස්තු රු. 99,291,971 ක් විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) SD/2024/130 දරන ඉඩම් අනුබෙදුම යටතේ කැබලි කරන ලද ඉඩමේ උතුරු මායිමෙහි ඉදිකර තිබූ උස අඩි 10 ක් හා දිග අඩි 30 ක් පමණ වන කළුගල් බැම්ම අවසරයකින් තොරව හා නිසි ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබූ අතර, එය පුපුරා ඉරි තැලීමට ලක්ව ඇති බවත්, අවදානම් තත්ත්වයක් පවතින බවට එම බැම්මට පහළින් සිටින ඉඩමේ හිමිකරු විසින් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර 2024 ඔක්තෝබර් 01 දින විගණනය විසින් සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී ඊට සම්බන්ධවූ තාක්ෂණ නිලධාරී විසින්ද බැම්මේ අවදානම තහවුරු කර තිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/B/2024/AQ/02 හා 2025 ජනවාරි 03 දිනැති විගණන විමසුම)



4

Scanned with CamScanner

(ආ) නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ II වන කොටසේ 27(3) වගන්තිය හා සංවර්ධන බලපත්‍රයේ කොන්දේසි අංක 06 ප්‍රකාරව පළාත් පාලන ආයතනයක් විසින් අනුකූලතා සහතිකයක් නිකුත් කරන තෙක් ප්‍රචාරණය කිරීමට ප්‍රවර්ධනය කිරීමට හෝ වෙනත් පාර්ශවයකට පැවරීම නොකළ යුතු වුවත්, එපරිදි කටයුතු නොකර අනුකූලතා සහතිකය ලබා ගැනීමට ප්‍රථම අංක 3388A දරන පිඹුරුපත් සැලැස්මේ අංක 09 කැබැල්ල විකුණා තිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/B/2024/AQ/02 හා 2025 ජනවාරි 03 දිනැති විගණන විමසුම)

(ඇ) ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකරන අවස්ථාව වන විට උක්ත ඉඩමේ අභ්‍යන්තර මාර්ග තාර අතුරා සකස් කර තිබූ නමුත්, තාර ඇතිරීමට ප්‍රථම මාර්ග නිසිලෙස ඝනවත් කර ප්‍රමාණවත් ඝනකමට ABC හා ගල් අතුරා නිසි ප්‍රමිතියට මාර්ගය සකස් කර නොතිබීම නිසා අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගයේ ස්ථාන කිහිපයක් වර්ෂාවට සෝදා පාළුවට ලක්ව තිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/B/2024/AQ/02 හා 2025 ජනවාරි 03 දිනැති විගණන විමසුම)

(ඈ) සංවර්ධන බලපත්‍රයෙහි කොන්දේසි අංක 03 ප්‍රකාරව ඉඩමේ වැසි ජල කාණු සභාවේ තාක්ෂණ නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ කොන්ක්‍රීට් යොදා සකස් කර වරලත් ඉංජිනේරුවරයෙකු වෙතින් සහතිකයක් ලබාගත යුතු බව දක්වා ඇතත් අභ්‍යන්තර කාණු පද්ධතිය කොන්ක්‍රීට් යොදා සකස් කර නොතිබුණි. මෙසේ සභාවේ අධීක්ෂණයක් නොමැතිව නිසි ප්‍රමිතියකින් තොරව කාණු හා මාර්ග පද්ධති ඉදිකර ඉඩම අනුබෙදුම් කිරීමට සහ කළමනාකාරීත්වය ඉඩ හැරීමෙන් එම මාර්ග හා ජලය බැස යාම සම්බන්ධව ඉදිරියේදී පැන නගින ගැටළුකාරී තත්ත්වයන්ට විසඳුම් ලබාදීමට සභාවට සිදුවී එමගින් සභාවට වැය බරක් ඇරීමට සිදුවිය හැකිවේ.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/B/2024/AQ/02 හා 2025 ජනවාරි 03 දිනැති විගණන විමසුම)



Scanned with CamScanner

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරික්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කලමනාකරණය

(i) 2013 වර්ෂයේ සිට සුල්තානාගොඩ කැකිල්ල ප්‍රදේශයේ පිහිටි රූඩ් 03 ක භූමියක් තුළ පවත්වා ගෙන යන කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ii) අලෙවි කළ නොහැකි නොදිරන කසළ කොම්පෝස්ට් භූමියෙහිම පස් දමා වසා දමනු ලබන අතර ඒවා බැහැර කිරීම සඳහා සභාව විසින් විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වෙබීනියා වත්ත ඉඩම හා සුල්තානාගොඩ ගුරුවලයාගොඩැල්ල (මනම්පේරි හෝම් ලැන්ඩ් කොබෙයිමලහේන) ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2009 ජුනි 17 දිනැති හා අංක 09/2009(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (I) වගන්තිය ප්‍රකාරව සියළුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළයුතු වුවත් සභාවේ නිලධාරීන් විසින් නිසි පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම පිටවීම සටහන් කර නොමැති



Scanned with CamScanner

අවස්ථාවන් 50 ක් පැවති අතර ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකරන ලද දිනයන් සඳහා හේතු දැක්වෙන තොරතුරුද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති සභාව සතු මාර්ග හඳුනාගෙන 24(1) වගන්තිය ප්‍රකාරව මාර්ගවල සලකුණු හා සීමා ලකුණු කර ඒවායේ නාම ලේඛණයක් පලකරනු ලැබිය යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. 1995 ජනවාරි 06 දිනැති අංක 853 දරන ගැසට් නිවේදනය මගින් සභා බලප්‍රදේශයේ මාර්ග 147 ක් පිළිබඳ විස්තර ප්‍රකාශයට පත්කර වසර 29 කට අධික කාලයක් ගතවී තිබුණි.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

## 3.3 මානව සම්පත් කළමණාකරණය.

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | අතිරික්ත | පුරප්පාඩු | 25/2014 චක්‍රලේඛයට අනු |
|---|---|---|---|---|---|
| තෘතියික | 01 | 02 | 01 | - | - |
| ද්විතියික | 33 | 55 | 24 | 02 | - |
| ප්‍රාථමික | 22 | 29 | 08 | 01 | 03 |
| | 56 | 86 | 33 | 03 | 03 |



ත

සේවක සංඛ්‍යා සැලැස්මේ අතිරික්තව පවතින තනතුරු 33 වියිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සේවක ඇප තැන්පතු ලබාගත් නිලධාරීන්ගේ ඇප මුදල් එම නිලධාරීන් සභාවෙන් ස්ථාන මාරු වී ගිය හෝ විශ්‍රාම ගිය වහාම නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත් සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය, විශ්‍රාම ගිය සහ සේවය හැර ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයකරගෙන තිබූ එකතුව රු. 31,757 ක් වූ ඇප මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඇ) සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවෙකු හා සෞඛ්‍ය කම්කරුවෙකු වෙත තනතුරට අදාළ නියමිත රාජකාරි පැවරීමකින් තොරව රාජකාරි පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 340,410 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලෙන් වැය කර තිබුණි. තවද බඳවාගෙන තිබූ කම්කරුවන් නියමිත රාජකාරියෙහි නොයෙදවීම නිසා මහජන සුභසාධනය, සෞඛ්‍ය කටයුතු හා මාර්ග නඩත්තු කටයුතු නිසි පරිදි සිදුකිරීමට නොහැකි වන බවත්, බඳවාගත් අරමුණ ඉෂ්ඨකර ගැනිමට නොහැකි වන බවද නිරීක්ෂණය විය.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

3.4 වත්කම් කළමණාකරණය
----------------------------

(අ) 2017 මාර්තු 19 දිනැති අංක දපස/15 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් ලිපිය ප්‍රකාරව පළාත් පාලන ආයතන සතු සෑම දේපලකටම වැට මායිම් දමා අනවසරයෙන් ඇතුළු වීමට නොහැකි වන සේ පවත්වා ගෙන යාමට සහ ගැටළු සහගත තත්ත්වයේ ඇති ඉඩම් මැන නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු වුවද සභාව සතු අක්කර 11 ක පමණ ඉඩම් කැබලි 18 ක් හා භූමි ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොමැති ඉඩම් කැබැල්ලක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. විස්තර උපලේඛණ IV හි දැක්වේ.



4

Scanned with CamScanner

(ආ) සභාව නමින් ලේඛණගත කර තිබූ නමුත් 2024 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයෙන් හඳුනා නොගත් ඉඩම් කැබලි 03 ක් හා ගොඩනැගිලි 01 ක් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඇ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් කැබලි 6 ක් හා ගොඩනැගිලි 6 ක් සභාව විසින් පරිහරණය කරනු ලැබුවද ඒවා නිරවුල් කර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඈ) සභාවට අයත් රූඩ් 08 ක පමණ වූ ඉඩම් කැබලි 4 ක් හා භූමි ප්‍රමාණය නිශ්චිතව හඳුනාගෙන නොමැති ඉඩම් කැබැල්ලක් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. විස්තර ඇමුණුම V හි දැක්වේ.

(ඉ) සභාව සතු අංක 53-5706 දරන කැබ් රථය අපහරණය කිරීම සඳහා 2020 අගෝස්තු 14 දින නිර්දේශ කර තිබූ අතර විගණන දිනය වූ 2024 නොවැම්බර් 04 දින වන විට වසර 04 කට අධික කාලයක් ගත වී තිබුණද අපහරණ කටයුතු අවසන් කිරීමට කටයුතු නොකර සභා භූමියෙහි ගාල්කර තිබුණි.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඊ) සභාව සතු අංක YTS-6208 දරන ගල්රෝල 2017 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර 2020 සැප්තැම්බර් 14 දින වෙන්දේසි කිරීමට නිර්දේශ ලබාදී විගණිත දිනය වන විට වසර 04 කට අධික කාලයක් ගතවී තිබුණද එම කටයුතු අවසන් කිරීමට කටයුතු නොකර තෙලිජ්ජවිල පැරණි ප්‍රාදේශීය සභා භූමියෙහි ගාල් කර තිබුණි.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)



Scanned with CamScanner

3.5 අවිධිමත් ගනුදෙනු

(අ) සභාව විසින් 2024 සැප්තැම්බර් 04 සිට විගණිත දිනය වූ 2024 ඔක්තෝබර් 28 දක්වා කාලපරිච්ඡේදය තුල එකතු වටිනාකම රු.22,142,373 ක් වූ ගෙවීම් වවුචර් 343 ක් සඳහා ගෙවීම් කර තිබුණද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 125 ප්‍රකාරව සම්මත වැය ලෙජරයක (පී.එස්. 12 ආකෘති පත්‍රය) ඇතුළත් කර නොතිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර 18 ක් නිකුත් කිරීමට අදාළව තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටු 04 ක් පවත්වා තිබූ අතර ඒ සඳහා සහභාගී වූ කමිටු සාමාජිකයන් සඳහා රු. 29,000 ක දීමනාවක් ගෙවීම් කර තිබුණි. මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2023 වර්ෂය සඳහා නිකුත් කර තිබූ කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත/නියමිත කටයුතු සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා නිකුත්කර තිබූ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3.4.1 (ආ) ප්‍රකාරව තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව සඳහා නිලධාරීන් පස් දෙනෙකු ප්‍රමාණවත් වුවත් සභාව විසින් පත්කර තිබූ කමිටුවෙහි යථෝක්ත වගන්තියෙහි සඳහන් කර ඇති තනතුරු වලින් පරිබාහිර නිලධාරීන්ද පත්කර තිබූ නිසා එම නිලධාරීන් වෙත මාර්ගෝපදේශයෙන් පරිබාහිරව රු. 13,000 ක දීමනා ගෙවීම් කර තිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

ප්‍රසම්පාදනය

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7)(4) ප්‍රකාරව විවෘත කරන ලද මිල ගණන්හි දින මුද්‍රාව තබා කෙටිසන යෙදිය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර දින මුද්‍රාව පමණක් තිබූ අවස්ථාවන් පැවතුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)



Scanned with CamScanner

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7)(5) ප්‍රකාරව ටෙන්ඩර් කැඳවීම අවසන් දිනට පසුව ඉදිරිපත් කරනු ලබන සියළුම මිලගණන් ප්‍රතික්ෂේප කළයුතු වුවත්, එපරිදි කටයුතු නොකර මිලගණන් විවෘත කරන ලද දිනයට පසුව සභාව වෙත ලැබී තිබූ මිලගණන්ද විවෘත කළ දිනයට අදාළ දින මුද්‍රාව තබා ප්‍රසම්පාදන කමිටුව විසින් විවෘත කර තිබූ අවස්ථාවන් පැවතුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7)(4) ප්‍රකාරව මිලගණන් කැඳවීමේ ලිපියෙහි සඳහන් වන දිනයට හා නියමිත වේලාවට මිල ගණන් විවෘත කළ යුතු වුවත් එපරිදි කටයුතු නොකළ අවස්ථාවන් පැවතුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඈ) සභාව විසින් පිළියෙල කර ආයතන වෙත ඉදිරිපත් කර තිබූ මිල කැඳවීම් ලිපියෙහි සඳහන් කොන්දේසි අනුව මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වුවත්, එම කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථාවන් පැවතුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඉ) සභාව විසින් අවස්ථා 02 කදී එකතු වටිනාකම රු.404,000 ක් වූ පරිගණක යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා මිලගණන් කැඳවීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 5.6.1 (අ) ප්‍රකාරව පිරිවිතර සකස් කර නොතිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)



Scanned with CamScanner

(ඔ) ප්‍රසම්පාදන කමිටු තීරණ ලේඛණය නිසි පරිදි පවත්වා නොතිබීම.

(i) ඉදිරිපත් කරන ලද ලංසු ඇගයීමෙන් පසු ප්‍රසම්පාදන කමිටුව විසින් සැපයුම්කරුවෙකු තෝරාගෙන ඒ පිළිබඳව 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 2.11.3(අ) ප්‍රකාරව සවිස්තරාත්මකව ප්‍රසම්පාදන තීරණය සටහන් කළ යුතු වුවත්, එපරිදි ප්‍රසම්පාදන තීරණය සඳහන් නොකර කමිටු සාමාජිකයින් විසින් සිය අත්සන පමණක් යොදා තිබුණු අවස්ථා දෙකක් පැවතුණි.

(ii) ප්‍රසම්පාදන කමිටු තීරණ වාර්තා කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 2.11.3 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුව විසින් සිය නම, තනතුර, තීරණයට එකඟතාවය හා අත්සන යෙදිය යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඖ) සභාවේ වාහන අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් අවස්ථා 05 කදී පෞද්ගලික ආයතනයන් වෙත එකතු වටිනාකම රු. 220,062 ක්වූ එකතු කල අගය මත බදු (VAT) ගෙවීම කර තිබූ අතර එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 ප්‍රකාරව බදු ඉන්වොයිසියක් (Tax invoice) ලබා නොගෙන නාමමාත්‍ර ඉන්වොයිසියක් (Proforma invoice) මත VAT බදු ගෙවීම කර තිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

(ඍ) සභාව විසින් 2024 ජනවාරි 01 දින සිට 2024 නොවැම්බර් 04 දක්වා කාලපරිච්ඡේදය තුලදී අවස්ථා 16 කදී සැපයුම්කරුවන් වෙත ගෙවන ලද රු.320,370 ක වැට් බදු පිළිබඳ තොරතුරු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ අංක 5.4.12 හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ 2019 ජුලි 09 දිනැති අංක CGIR/2019/3V(ins&cir) දරන චක්‍රලේඛය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)



Scanned with CamScanner

(එ) නියැදි විගණන පරීක්ෂාවේදී අංක LL-6967 ටිපර් රථය සඳහා රු. 168,080 ක් වටනා ටයර් 02 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඇගයීමේදී වැට් බදු වටිනාකම බැහැර කර ඇගයීම සිදුකළ යුතු වුවත්, සභාව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.
(ඡේදයට යොමුව - SPLG/MT/A/MaliPS/C,D/2024/AQ/01 හා 2024 නොවැම්බර් 21 දිනැති විගණන විමසුම)

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය.

4.1 අයවැය පාලනය.

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත පරිදි සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛණය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

(අ) ආදායම් විෂයන් 03 ක හිතකර විචලනයන්ගේ එකතුව රු. 3,520,169 ක් වූ අතර, එම අගයන් සියයට 03 ත් සියයට 38 ත් අතර පරාසයක විය.

(ආ) ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 8,249,707ක් වූ අතර, එම අගයන් සියයට 01 ත් සියයට 12 ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) වියදම් විෂයයන් 07 ක අයවැයගත වියදම සහ සත්‍ය වියදම අතර එකතුව රු.23,078,095 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය වූ අතර, එම අගයන් සියයට 07 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) වියදම් විෂයයක අහිතකර විචලනය රු.84,426 ක් වූ අතර, එම අගය සියයට 05 ක් විය. විස්තරාත්මක තොරතුරු උපලේඛණ VI හි දැක්වේ.

විගණකාධිපති.

ඌ



Scanned with CamScanner

අඩුවෙන් ප්‍රාග්ධනිත කරන ලද ඉඩම් ගොඩනැගිලි පිළිබඳ විස්තර -ඡේදයට යොමුව 1.2.1(අ).

| | ඉඩම/ගොඩනැගිල්ල | ගිණුම්ගත කළ වටිනාකම රු | ගිණුම්ගත කළයුතු වටිනාකම රු. | අඩුවෙන් ගිණුම්ගත කළ වටිනාකම රු. |
|---|---|---|---|---|
| (i) | මාලිම්බඩ නව සභා කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම | 44,357,447 | 44,320,868 | 36,579 |
| (ii) | ගල්ඇන්ද කුට්ටිය ප්‍රජා ශාලාව. | 8,326,879 | 3,019,447 | 5,307,432 |
| (iii) | මාලිම්බඩ පොදු වෙළෙඳපොල ගොඩනැගිල්ල හා ඉඩම | 42,802,936 | 34,469,539 | 8,333,397 |
| (iv) | හක්මණගේ දිවෙල්වත්ත බොක්කෙමුල්ල හේන ඉඩම (ද ෆිනෑන්ස් ඉඩම - නව වාහන අංගනය) | 8,351,678 | 8,229,684 | 121,994 |
| | | 103,838,940 | 90,039,538 | 13,799,402 |



Scanned with CamScanner

වැඩියෙන් ගිණුම්ගත කරන ලද ප්‍රාග්ධන ණයහිමි ශේෂ පිළිබඳ විස්තර -ඡේදයට යොමුව 1.2.1 (ඈ)

| | ඉඩම/ගොඩනැගිල්ල | ගිණුම්ගත කළ වටිනාකම<br>රු. | ගිණුම්ගත කළයුතු වටිනාකම<br>රු. | වැඩියෙන් ගිණුම්ගත කළ වටිනාකම<br>රු. |
|---|---|---|---|---|
| (i) | ගල්පමුණ වැවේවත්ත මාර්ගය ක්‍රිස්ට් මහතාගේ නිවස අසල සිට ඉදිරියට සංවර්ධනය කිරීම. | 49,409 | - | 49,4[illegible] |
| (ii) | වෙළෙඳගොඩ බදුවත්ත පාර සංවර්ධනය කිරීම. | 134,820 | 108,949 | 25,8[illegible] |
| (iii) | මාලිම්බඩ පැරණි පුස්තකාලයේ වහල සැකසීම | 1,536,724 | 121,994 | 1,414,7[illegible] |
| (iv) | ගල්පොත්තහේන පාර සංවර්ධනය කිරීම. | 317,073 | 277,930 | 39,1[illegible] |
| (v) | කානියවත්ත මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම. | 451,892 | - | 451,8[illegible] |
| | | | | 1,981,0[illegible] |

ලැබිය යුතු මුද්දර ගාස්තු සඳහා වැඩිපුර ගිණුම්ගත කිරීම පිළිබඳ විස්තර - ඡේදයට යොමුව 1.2.1 (එ)

| | 2021 | 2022 | 2023 | 2024 | එකතුව |
|---|---|---|---|---|---|
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද උපලේඛන අනුව ලැබිය යුතු මුදල | 37,067,846 | 26,410,736 | 20,659,250 | - | 84,137,832 |
| ලද මුදල | 36,567,412 | 26,410,736 | 11,446,104 | - | 74,424,252 |
| තවදුරටත් ලැබිය යුතු මුදල | 500,434 | - | 9,213,146 | - | 9,713,580 |
| ප්‍රතිපාදනය කර ඇති මුදල | 638,600 | 5,999,475 | 17,653,896 | 75,000,000 | 99,291,971 |
| වැඩිපුර/(අඩුවෙන්) ප්‍රතිපාදනය කර ඇති මුදල | 138,166 | 5,999,475 | 8,440.750 | 75,000,000 | 89,578,391 |



Scanned with CamScanner

වැට මායිම් සකස් නොකරන ලද සභාව සතු ඉඩම් පිළිබඳ විස්තර - ඡේදයට යොමුව - 3.4 (අ)

| | ඉඩම පිහිටි ස්ථානය | වටිනාකම රු. | බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | | | අක්. | රූඩ |
| 01 | හොරගොඩ පොදු සුසාන භූමිය | 4,000 | - | 2 |
| 02 | මාලිම්බඩ සොහොන් භූමිය අලවත්තහේන | 108,000 | - | 3 |
| 03 | සුල්තානාගොඩ දිග්ගහගොඩ වත්ත ගොඩනැගිල්ල | 201,000 | - | - |
| 04 | පරණවත්තහේන | 5,000 | - | - |
| 05 | ඇල්ගිරිය දූන්වත්ත පොදු ළිඳ පිහිටි ඉඩම | 24,890 | - | - |
| 06 | නාකන්දගොඩවත්ත සෙන්ට්‍රල් පාර්ක් | 3,000,000 | 3 | 3 |
| 07 | කහටගහහේන ඉඩම සුල්තානාගොඩ | 607,810 | - | - |
| 08 | ආදදොල වත්ත (ලිබර්ටි ටෙරන්ස්) | 150,000 | - | 3 |
| 09 | ශාන්ති වත්ත (මිත්‍රානන්ද වත්ත) | 340,000 | - | - |
| 10 | නැටව්ව වත්ත කැබලි අංක 5,6 | 650,000 | - | - |
| 11 | නාකන්ද ඉඩම | 280,000 | - | - |
| 12 | තල්ගස්වත්ත සුල්තානාගොඩ ඉඩම | 1,400,000 | - | - |
| 13 | කප්පරගේ හේන හෙවත් කාපිරිගෙ හේන | 450,000 | - | - |
| 14 | පුවක්දොළ පොදු සුසාන භූමිය | 2,400,000 | - | 3 |
| 15 | හක්මණගේ දිවෙල්වත්ත බොක්කේමුල්ල හේන ඉඩම | 8,229,684 | - | - |
| 16 | පැලිගහහේන (කොලේජ් වීව්) ඉඩම | 5,504,750 | - | 1 |
| 17 | ගොඩගෙදර මුල්ල වත්ත (රෝස්වුඩ් ගාර්ඩන්) | 7,133,603 | 2 | - |
| 18 | සුල්තානාගොඩ ගුනවලයාගොඩැල්ල (මනම්පේරි හෝම් ලෑන්ඩ් කොබෙයිමල් හේන ඉඩම) | තක්සේරු කර නොමැත | - | - |
| 19 | වෛබීනියාවත්ත | තක්සේරු කර නොමැත | ප්‍රමාණය දක්වා | |